# ලෝක දේශගුණික ප්‍රකාශනය

දේශගුණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය වඩාත් විද්‍යාත්මක විය යුතු අතර දේශගුණික විද්‍යාව දේශපාලනීකරණය වීම අවම විය යුතුය. වඩාත් නිශ්චිතව විද්‍යාඥයෝ විසින් අවධාරණය කළ යුතුව ඇත්තේ ඔවුන්ගේ ආකෘතිමය ප්‍රතිඵල මැජික් එකක ප්‍රතිඵලයක් ලෙස ඉදිරිපත් නොකිරීමටත් පරිගණක මගින් නිපදවන ආකෘතින් මිනිස් නිර්මාණයන් බවත් අවධාරණය කරගත යුතුය. ඒවායෙන් ලැබෙන ආකෘතිමය ප්‍රතිඵල රඳා පවතින්නේ න්‍යායධරයන් සහ පරිගණක වැඩසටහන්කරුවන් විසින් එයට ඇතුළත් කරන උපකල්පිත, අනුමාන, සම්බන්ධතා, පරාමිතිකරණ, ස්ථායිතා සංරෝධක වැනි දේ මතය. අවාසනාවකට මෙන් ප්‍රධාන ධාරාවේ නිල දේශගුණ විද්‍යාව විසින් මෙම ඇතුළත් කිරීම් පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත් නොකරයි.

දේශගුණික ආකෘතියක ප්‍රතිඵලය විශ්වාස කිරීමට නම් එම ආකෘති නිර්මාණය කරන්නන් ඒ සඳහා ඇතුළත් කරන ලද දේවල් විශ්වාස කළ හැකි විය යුතුය. දේශගුණික ආකෘතින්වලට මුල් තැනක් දෙමින් පවත්වාගෙන යන වර්තමාන දේශගුණ සංවාදයේ මූලික ගැටළුව මෙය බව ඉතා නිරවුල්ව හඳුනාගත හැකිය. දේශගුණික විද්‍යාව ස්වයං-විවේචනාත්මක විද්‍යාවක් මත නොව ඇදහිලි සහ විශ්වාසයන් මත පදනම් සංවාදයක් බවට පිරිහී තිබේ. අපරිණත දේශගුණික ආකෘතින් අන්ධ ලෙස විශ්වාස කිරීමේ වරදින් අප අපවම නිදහස් කරගත යුතුව තිබේ. අනාගතයේදී දේශගුණික පර්යේෂණ තුළ අනුභූති විද්‍යාවට වැඩි අවධාරණයක් ලබාදිය යුතුය.

## හදිසි දේශගුණික විපර්යාස අවදානමක් නැත.

ලෝකය පුරා විද්‍යාඥයන් සහ වෘත්තිකයන් 1900 කට අධික පිරිසක් මෙම හදිසි පණිවුඩය සුදානම් කර තිබේ. දේශගුණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය වඩාත් විද්‍යාත්මක විය යුතු අතර දේශගුණික විද්‍යාව දේශපාලනීකරණය වීම අවම විය යුතුය. ගෝලීය උණුසුම ඉහළ යාම පිළිබඳ තමන්ගේ අනුමාන කිරීම්වල පවත්නා අවිනිශ්චිතතාවන් සහ අතිශයෝක්තීන් පිළිබඳව විද්‍යාඥයන් විසින් විවෘතව කරුණු ඉදිරිපත් කළ යුතුව ඇති අතර දේශපාලනඥයන් විසින් තමන්ගේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සැබෑ පිරිවැයද එවායේ ප්‍රබන්ධමය ප්‍රතිලාභයන්ද අපක්ෂපාති ලෙස ගණනය කළ යුතුව තිබේ

## ගෝලීය උණුසුම ඉහළයාමට මානව ක්‍රියාකාරකම් මෙන්ම ස්වාභාවික සාධකද බලපායි.

භූගෝලීය ලේඛනාගාර දත්ත විසින් හෙළිකරන්නේ පෘථිවි දේශගුණය විපර්යාස සිදුවීම් චක්‍රලී ස්වාභාවික ලෙස සිදුවන සිසිල් සහ උණුසුම් වීමේ අවධීන්ගේ චක්‍රීය පැවැත්මක් සහිත පෘථිවිය මෙන්ම පැරණි බවය. කෙටි අයිස් යුගයේ නිමාව සනිටුහන් වන්නේ 1850 තරම් මෑතකදීය. එහෙයින් දැන් අපි උණුසුම් කාල පරිච්ඡේදයක් අත්දකිමින් පැවැතීම පුදුමයට කරුණක් නොවේ.

## උණුසුම ඉහළ යාම සිදුවන්නේ අනුමාන කළාට වඩා බොහෝ මන්දගාමී ආකාරයකිනි.

උණුසුම ඉහළයාම සිදුවන්නේ මානව ක්‍රියාකාරිත්ව සාධකයේ බලය ඇසුරෙන් ගොඩනගන ලද ආකෘතින් මත පදනම්ව IPCC විසින් කරන ලද අනුමානයන්ට වඩා සැළකියයුතු තරම් අඩුවෙනි. සැබෑ ලෝකය සහ ආකෘතිගත කරන ලද ලෝකය අතර දුර විසින් අපට පවසන්නේ අප තවමත් දේශගුණ විපර්යාසයන් පිළිබඳ අවබෝධ කරගැනීමේ ඉලක්කයෙන් බොහෝ දුර බවය.

## දේශගුණික ප්‍රතිපත්ති ගොඩනගා ඇත්තේ අප්‍රමාණවත් ආකෘති මතය.

දේශගුණික ආකෘති බොහෝ අඩුපාඩු සහිතය. එමෙන්ම ඒවා ගෝලීය ප්‍රතිපත්ති සම්පාදනයේ මෙවලම් ලෙස යොදාගැනීමට කොහෙත්ම නුසුදුසුය. හරිතාගාරවායු ආවරණය බලපෑම කාබන්ඩයොක්සයිඩ් නිසා සිදුවන බව එවා විසින් පෙන්වයි. එයට අමතරව වායුගෝලය කාබන්ඩයොක්සයිඩ් වලින් පෝෂණය කිරීම වාසි සහගත ප්‍රතිඵල ලබා දෙන්නේය යන සාධකය ඒවා විසින් නොතකා හැර ඇත.

## කාබන්ඩයොක්සයිඩ් යනු මිහිමත සියලු ජීවින්ගේ පදනමයි.

කාබන්ඩයොක්සයිඩ් යනු දූෂකයක් නොවේ.එය මිහිමත සියලු ජීවින්ගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. කාබන් ඩයොක්සයිඩ් වැඩිවීම ස්වභාව ධර්මය මෙන්ම පොලොව කොළපැහැති ශාකවලින් බහුල කිරීම සඳහාද වාසියකි. වායුගෝලයේ අතිරේක කාබන්ඩයොක්සයිඩ් විසින් ගෝලීය ශාක බහුලතාව ප්‍රවර්ධනය කරයි. එමෙන්ම එමගින් ලෝකය පුරා අස්වැන්න ඉහළ නංවයි.

**ගෝලීය උණුසුම ඉහළ යාම විසින් ස්වාභාවික ව්‍යසනයන් වැඩි කර නැත.**

ගෝලීය උණුසුම ඉහළයාම හේතුවෙන් සුළිකුණාටු, ජලගැලීම්, නියඟ සහ එවැනි ස්වාභාවික ව්‍යසනයන් තීව්‍ර කරන බවට හෝ ඒවා නිතර ඇති කරන බවට හෝ සංඛ්‍යාත්මක සාක්ෂි නැත.. කෙසේ නමුත් කාබන්ඩයොක්සයිඩ් අඩුකිරීමේ පිරිවැය අධික ක්‍රියාමාර්ග විසින් හානියක් ඇති කරන බවට බලගතු සාක්ෂි තිබේ.

**දේශගුණික ප්‍රතිපත්ති විද්‍යාත්මක සහ ආර්ථික යථාර්ථයන්ට ගරු කළ යුතුය.**

හදිසි දේශගුණික අවදානමක් නැත. එහෙයින් අනතුරු ඇඟවීමේ නලා නාද කරමින් කැලැඹීමක් ඇති කිරීමේ උවමනාවක් නැත. 2025 වනවිට කාබන් විමෝචනය ශුන්‍යකිරීමේ ( net-zero CO2 policy ) හානිදායක සහ යථාර්ථවාදි නොවන පිළිවෙතට අපි දැඩි ලෙස විරෝධය පළකරමු. වඩාත් යහපත් ප්‍රවේශයක් මතුවන්නේ නම් (සැබැවින්ම එවැන්නක් සිදුවනු ඇත) අපට සියල්ල සලකා බැලීමටත් ප්‍රත්‍යනුවර්තනය වීමටත් බොහෝ කල් තිබේ. ගෝලීය ප්‍රතිපත්තියේ ඉලක්කය විය යුත්තේ ‘‘සියළු දෙනාටම සමෘද්ධිය‘‘ යන්නයි. ඒ සඳහා ලාභදායි සහ විශ්වාසනීය සැපයුමක් සහිත බලශක්තිය සියලු දෙනාටම ලබාදිය යුතුව ඇත. සමෘද්ධිමත් සමාජයක ස්ත්‍රීන් සහ පුරුෂයන් මනා අධ්‍යාපනයක් සහිතවූවන්ය. එවැනි සමාජයක උපත් අනුපාතිකයද අඩුවන අතර ඔවුහු සිය පරිසරය ගැන ද දැඩි සැලකිල්ලක් දක්වති.

**පසුවදන**

මෙම ගෝලීය දේශගුණික ප්‍රකාශනය (The World Climate Declaration -WCD) විසින් ලෝකය පුරා විවිධ ප්‍රවීණ විද්‍යාඥයන් රැසක් එක්සත් කරන ලදි.දේශගුණික විපර්යාස පිළිබඳ සමබර, අපක්ෂපාති සහ නියම දෘෂ්ටියකට ළඟා වීම සඳහා මෙම කණ්ඩායමේ සැලකිය යුතු දැනුම සහ අත්දැකීම් අත්‍යවශ්‍ය වේ. මෙතැන් සිට මෙම කණ්ඩායම ක්‍රියාත්මක වන්නේ "ගෝලීය දේශගුණික බුද්ධි කණ්ඩායම" (Global Climate Intelligence Group-The CLINTEL Group) යන නාමය යටතේය.මෙම කණ්ඩායම ලොව පුරා රජයන් සහ සමාගම් වෙත දේශගුණික විපර්යාස සහ බලශක්ති සංක්‍රාන්තිය පිළිබඳ ඔවුන්ගේ ආරාධනය පරිදි හෝ නැතහොත් විවෘත උපදෙස් ලබා දෙනු ඇත.

(2025 දෙසැම්බරය වනවිට මෙම ප්‍රකාශනයට ලෝකය පුරා දේශගුණික විද්‍යාඥයන් සහ එම ක්ෂේත්‍ර යේ වෘත්තීය වේදීන් 2037 ක් මෙම ප්‍රකාශනයට අත්සන් තබා ඇත.අත්සන් නාම ලේඛනය සඳහා ඉංග්‍රීසි PDF පිටපත බලන්න)